Lesson 13 **අතීත කාල ක්‍රියා - ප්‍රායෝගික උදාහරණ**

පසුගිය පාඩමෙන් අපි ඉගෙන ගන්තේ සිදුවී අවසන් වූ ක්‍රියා, එනම් අතීත කාල ක්‍රියාග ඒවා ප්‍රකාශ කරන ආකාරය ඒවායේ නැත අර්ථය සහ ප්‍රශ්න අර්ථය ඒවා සෑදෙන ආකාරය අපි ඉගෙන ගත්තාග එම කාලය ඉංග්‍රීසියෙන් හඳුන්වන්නෙ simple past tense - සරල අතීත කාලය ලෙස. මේ පාඩමේදි අතීත කාල ක්‍රියා සඳහා තවත් ප්‍රායෝගික උදාහරණ අපි ඉගෙන ගනිමු. මේවා ඔබට ඉතාමත්ම ප්‍රයෝජනවත් වේවි. මන්ද අපි එදිනෙදා ජීවිතයේ කතාබහ කරන විට වැඩිපුරම භාවිතා වන කාලයක් තමයි අතීත කාලය. ඉතාම ලස්සන වාක්‍ය මෙහි දී තිබෙනවා. ඒවා හොඳින් මතක තබාගෙන එදිනෙදා කතාබහේදී භාවිතා කරන්න. ඒවායේ කර්තෘ හෝ කර්මය වෙනස් කල විට අවස්ථාවට අනුව තවත් වාක්‍යය සිය ගණනක් සෑදිය හැකියි. මෙහිදීත් ඇතැම් වාක්‍යය වල අතීත කාලයේ ප්‍රධාන වාක්‍යයත් සමඟ තවත් අතීත කාලයේ වාක්‍යය බැඳී තිබෙනවා. ඒවා කෙරෙහි හොඳින් අවධානය යොමු කරන්න

I got back very late last night
අයි ගොට් බැක් වෙරි ලේට් ලාස්ට් නයිට්
මම ඊයෙ රෑ ගොඩක් පරක්කු වෙලා ගෙදර ආවේ

It rained hard/heavily yesterday
ඉට් රේන්ඩ් හාඩ්/හෙවිලි යෙස්ට(ර්)ඩේ
ඊයේ තදින් වැස්සා

She rang me up last night
ෂී රෑං මී අප් ලාස්ට් නයිට්
ඇය ඊයේ රෑ මට කෝල් කලා

I finished my work and went to bed early
අයි ෆිනිෂ්ඩ් මයි ව(ර්)ක් ඇන්ඩ් වෙන්ට් ටු බෙඩ් අ(ර්)ලි
මගේ මම මගේ වැඩ ඉවර කරලා වේලාසනින් නිදාගන්න ගියා

I cut my finger when I was cooking
අයි කට් මයි ෆින්ග(ර්) වෙන් අයි වෝස් කුකිං
මම උයන අතරේ මගේ ඇඟිල්ල කැපුනා (මම මගෙ ඇගිල්ල කැපුවා කියලා නෙමෙයි මෙතන අදහස් වෙන්නෙ) (when - වෙන් - විට )

She slipped and fell heavily
ෂී ස්ලිප්ඩ් ඇන්ඩ් ෆෙල් හෙව්ලි
ඇය ලිස්සලා තදින් වැටුනා

He injured his leg while playing
හී ඉන්ජ(ර්)ඩ් හිස් ලෙග් වයිල් ප්ලේයිං
ඔහු සෙල්ලම් කරන අතරේ ඔහුගේ කකුල තුවාල වුනා (ඔහු ඔහුගෙ කකුල තුවාල කලා කියලා නෙවෙයි මීන් අදහස් වෙන්නෙ)

My alarm didn't go off today
මයි එලාම් ඩිඩ්න්ට් ගෝ ඕෆ් ටුඩේ
අද මගේ එලාම් එක වැදුනෙ නෑ

Boss blamed me for being late
බොස් බ්ලේම්ඩ් මී ෆෝ බීන් ලේට්
පරක්කු වුනාට බොස් මට බැන්නා

I sent him a letter
අයි සෙන්ට් හිම් අ ලෙට(ර්)
මම ඔහුට ලියුමක් යැව්වා

I received your mail /letter
අයි රිසීව්ඩ් යුව(ර්) මේල් / ලෙට(ර්)
මට ඔයාගෙ මේල් එක / ලියුම හම්බ වුනා

I waited for two hours but she didn't come
අයි වේටඩ් ෆෝ ටූ අව(ර්)ස් බට් ෂී ඩිඩ්න්ට් කම්
මම පැය 2ක් බලන් හිටියා නමුත් ඇය ආවෙ නැහැ

He rushed out in a hurry
හී රෂ්ඩ් අවුට් ඉන් අ හරි
ඔහු කලබලයෙන් පිටව ගියා

I kept the door closed/ locked
අයි කෙප්ට් ද ඩෝ ක්ලෝස්ඩ් / ලොක්ඩ්
මම දොර වහල තිබ්බා / ලොක් කරලා තිබ්බා

He asked me for some money
හී ආස්ක්ඩ් මී ෆෝ සම් මනි
ඔහු මගෙන් සල්ලි ටිකක් ඉල්ලුව

He looked very tired when I saw him last evening
හී ලුක්ඩ් වෙරි ටය(ර්)ඩ් වෙන් අයි සෝ හිම් ලාස්ට් ඊව්නිං
ඔහු ගොඩක් මහන්සි පාට පෙනුනා ඊයේ හැන්දෑවේ මම ඔහුව දකින කොට

She looked angry when she saw him
ෂී ලුක්ඩ් ඇංග්‍රි වෙන් ෂී සෝ හිම්
ඔහුව දැක්කාම ඇය කෝප වූ බව පෙනුනා

I applied for / asked for two weeks leave
අයි ඇප්ලයිඩ් ෆෝ / ආස්ක්ඩ් ෆෝ ටූ වීක්ස් ලීව්
මම ඉල්ලුම් කලා / ඉල්ලුවා සති 2ක නිවාඩුවක්
(aapply for - ඉල්ලුම් කරනවා / ask for - ඉල්ලනවා )

Boss granted me/ gave me two weeks leave
බොස් ග්‍රාන්ටඩ් මී/ ගේව් මී ටූ වීක්ස් ලීව්
බොස් මට සති 2ක නිවාඩු දුන්නා (grant - ප්‍රධානය කරනවා / දෙනවා)

We became tired
වී බිකේම් ටය(ර්)ඩ්
අපි වෙහෙසට පත් වුණා

He put on a new shirt and went out
හී පුට් ඔන්(පුටෝන්) අ නිව් ෂ(ර්)ට් ඇන්ඩ් වෙන්ට් අවුට්
ඔහුව අලුත් ෂ(ර්)ට් එකක් දාගෙන එළියට ගියා

Lights went off suddenly
ලයිට්ස් වෙන්ට් ඕෆ් සඩන්ලි
හදිසියේම ලයිට් ගියා

Lights went on after one hour
ලයිට්ස් වෙන්ට් ඔන් ආෆ්ට(ර්) වන් අව(ර්)
පැයකට පස්සෙ ලයිට් ආවා

She began to cry
ෂී බිගෑන් ටූ ක්‍රයි
ඇය අඬන්න පටන් ගත්තා

It rained hard and I got wet very badly
රේන්ඩ් හාඩ් ඇන්ඩ් අයි ගොට් වෙට් වෙරි බෑඩ්ලි
හයියෙන් වැස්සා, මාව හොඳටම තෙමුනා, (හයියෙන් වැහැලා මාව හොඳටම තෙමුනා)

I met him on my way to the bank
අයි මෙට් හිම් ඔන් මයි වේ ටු ද බෑංක්
මට ඔහුව හමුවුණා බැංකුවට යන අතර

Something hit me on the head
සම්තිං හිට් මී ඔන් ද හෙඩ්
මොකක්ද මගේ ඔළුවට වැදුණා

The car broke down on the way
ද කා(ර්) බ්‍රෝක් ඩවුන් ඔන් ද වේ.
කාරෙක මගදී කැඩුනා

Baby awoke with a scream
බේබි අවෝක් විත් අ ස්ක්‍රීම්
බබා කෑගහගෙන අවදි වුනා (awake - අවේක් - අවදි වෙනවා / awoke - අවෝක් - අවදි වුනා )
( scream -කෑගහනවා/ කෑගැහිල්ල)

He kissed her on the cheeks
හී කිස්ඩ් හ(ර්) ඔන් ද චීක්ස්
ඔහු ඇගේ කම්මුල් සිප ගත්තා

He behaved very badly
හී බිහේව්ඩ් වෙරි බෑඩ්ලි
ඔහු හරිම නරක විදියට හැසිරුන

Everything went on nicely
එව්රිතිං වෙන්ට් ඔන් නයිස්ලි
හැමදේම ලස්සනට කෙරුණා / වුනා

I heard like someone screaming
අයි හ(ර්)ඩ් ලයික් සම්වන් සික්‍රීමිං
මට ඇහුණා කවුරුහරි කෑගහනවා වගේ

I didn't realize it at the time
අයි ඩිඩ්න්ට් රියලයිස් ඉට් ඇට් ද ටයිම්
මට ඒ වෙලාවෙ ඒක අවබෝධ වුනේ නෑ

The meeting lasted only 30 minutes
ද මීටිං ලාස්ටඩ් ඔන්ලි  ත(ර්)ටි මිනිට්ස්
රැස්වීම් තිබුණේ මිනිත්තු 30 ක් විතරයි

It didn't last long
ඉට් ඩිඩ්න්ට් ලාස්ට් ලෝංග්
ඒක වැඩි කල් / වැඩි වෙලා තිබුණෙ නෑ

He met with an accident
හී මෙට් විත් ඇන් ඇක්සිටන්ඩ්
ඔහු අනතුරකට මුහුණ පෑවා / අනතුරුකට ලක් වුණා

I knew it
අයි නිව් ඉට්
මම ඒක දැනගත්තා / දැනං හිටියා

I knew that it was a lie
අයි නිව් දැට් ඉට් වෝස් අ ලයි
මම දැනගත්තා ඒක බොරුවක් බව (එතන that කියන්නෙ බව/කියලා)

I got to know him through a friend of mine
අයි ගොට් ටු නෝ හිම් ත්රූ අ ෆ්‍රෙන්ඩ් ඔෆ් මයින්
මම ඔහුව දැනගත්තෙ මගේ යාළුවෙකු හරහා (get to know - දැන ගන්නවා)

Did you do (what I told you to do) ?
ඩිඩ් යු ඩූ වට් අයි ටෝල්ඩ් යූ ටූ ඩූ ?
මම ඔයාට කරන්න කියපු දේ ඔයා කලාද? (එතන what කියන එකෙන් අදහස් වෙන්නෙ දෙය කියන එක)

Did you give him the message?
ඩිඩ් යූ ගිව් හිම් ද මැසේජ් ?
ඔයා ඔහුට පනිවිඩය දුන්නද ?

Didn't you see her this morning ?
ඩිඩ්න්ට් යු සී හ(ර්) දිස් මෝනිං රෑ
ඔයා අද උදේ ඇයව දැක්කෙ නැද්ද ?

Didn't you sleep well last night?
ඩිඩ්න්ට් යු ස්ලීප් වෙල් ලාස්ට් නයිට්?
ඔයා ඊයෙ රෑ හොඳට නිදා ගත්තෙ නැද්ද?

He died of an accident /a cancer/a heart attack
හී ඩයිඩ් ඔෆ් ඇන් ඇක්සිඩන්ට් /අ කැන්ස(ර්)/ අ හා(ර්)ට්ඇටෑක්
ඔහු මැරුණා හදිසි අනතුරකින් /පිළිකාවකින් /හෘදයාබාධයකින්

I didn't expect this to happen
අයි ඩිඩ්න්ට් එක්ස්පෙක්ට් දිස් ටූ හැපන්
මම බලාපොරොත්තු වුණේ නෑ මේක වෙයි කියලා (expect - එක්ස්පෙක්ට් - බලාපොරොත්තු වෙනවා)

He fell ill suddenly
හී ෆෙල් ඉල් සඩ්න්ලි
ඔහු හදිසියේ අසනීප වුණා (fall ill - ෆෝල් ඉල් - අසනීප වෙනවා / fell ill - ෆෙල් ඉල් - අසනීප වෙනවා )

We got caught in the rain
වී ගොට් කෝට් ඉන් ද රේන්
අපි වැස්සට අහුවුනා (get caught-අහුවෙනවා / got cuaght - අහු වුනා )

I felt sad
අයි ෆෙල්ට් සෑඩ්
මට දුක හිතුනා (feel -ෆීල් - දැනෙනවා ,හැඟෙනවා / felt - ෆෙල්ට් - දැනුනා )

Finally she gave up hopes
ෆයිනලි ෂී ගේව් අප් හෝප්ස්
අන්තිමේදී ඇය බලාපොරොත්තු අතහැරියා

He never came to see us
හී නෙව(ර්) කේම් ටු සී අස්
ඔහු කවදාවත් ආවෙ නැහැ අපිව බලන්න

She never kept her promise
ෂී නෙව(ර්) කෙප්ට් හ(ර්) ප්‍රොමිස්
ඇය කවදාවත් ඇගේ පොරොන්දුව ඉටු කලේ නැහැ (keep a promise- පොරොන්දුවක් ඉටකරනවා)
[ඉහත ආකාරයට never- (කවදාවත් නෑ) යෙදුනම ඒ වාක්‍යයට did not එකතු කරලා ඒක අමුතුවෙන් නැතාර්ථයට හරවන්න අවශ්‍ය නැහැ මොකද never වල නැතාර්ථ තේරුම තිබෙන නිසා]

He lied to me
හී ලයිඩ් ටු මී
ඔහු මට බොරු කිව්වා

I lost my purse
අයි ලොස්ට් මයි ප(ර්)ස්
මගේ ප(ර්)ස් එක නැති වුනා

He spent a lot of money
හී ස්පෙන්ට් අ ලොට් ඔෆ් (ලොටොෆ්) මනී
ඔහු ගොඩාක් සල්ලි වියදම් කළා

I found this lying on the floor
අයි ෆවුන්ඩ් දිස් ලයිං ඔන් ද ෆ්ලෝ
මට මේක හම්බ වුනා බිම වැටිලා තියලා

She blamed me for being late
ෂී බ්ලේම්ඩ් මී ෆෝ බීන් ලේට්
ඇය මට බැන්නා පරක්කු වුනාට

The car didn’t start
ද කා(ර්) ඩිඩ්න්ට් ස්ටාට්
කාර් එක ස්ටාට් වුනේ නැහැ

The bus didn’t come on time
ද බස් ඩිඩ්න්ට් කම් ඔන් ටයිම්
බස් එක වෙලාවට ආවේ නැහැ

He didn’t keep his promise
හී ඩිඩ්න්ට් කීප් හිස් ප්‍රොමිස්
ඔහු ඔහුගේ පොරොන්දුව ඉෂ්ට කලේ නැහැ
It didn’t happen
ඉට් ඩිඩ්න්ට් හැපන්
එය සිදු වුනේ නැහැ

They didn’t wait for us
දේ ඩිඩ්න්ට් වේට් ෆෝ අස්
ඔවුන් අපි එනකල් හිටියේ නැහැ

I didn’t ask about it
අයි ඩිඩ්න්ට් ආස්ක් අබවුට් ඉට්
මම ඒ ගැන ඇහුවේ නැහැ

We didn’t get the tickets
වී ඩිඩ්න්ට් ගෙට් ද ටිකට්ස්
අපිට ටිකට් හම්බ වුනේ නැහැ

I didn’t say a word
අයි ඩිඩ්න්ට් සේ අ ව(ර්)ඩ්
මම වචනයක් වත් කිව්වේ නැහැ

He didn’t tell us anything about it
හී ඩිඩ්න්ට් ටෙල් අස් එනිතින් අබවුට් ඉට්
ඔහු අපිට ඒ ගැන කිසිදෙයක් කිව්වේ නැහැ

He didn’t take his dinner
හී ඩිඩින්ට් ටේක් හිස් ඩින(ර්)
ඔහු රෑ කෑම ගත්තේ නැහැ

She didn’t talk to me at the party
ෂී ඩිඩින්ට් ටෝක් ටු මී ඇට් ද පාටි
පාටි එකේදී ඇය මට කතා කලේ නැහැ

I didn’t find my lost keys
අයි ඩිඩින්ට් ෆයින්ඩ් මයි ලොස්ට් කීස්
මට මගේ නැතිවුණු යතුරු හම්බ වුනේ නැහැ

Did you find the place ?
ඩිඩ් යූ ෆයින්ඩ් ද ප්ලේස් ?
ඔයා තැන හොයා ගත්තද ?

Did she tell you about the incident ?
ඩිඩ් ෂී ටෙල් යූ අබවුට් දි ඉන්සිඩන්ට් ?
ඇය ඔබට සිදුවීම ගැන කිව්වද ?

Did you get late ?
ඩිඩ් යූ ගෙට් ලේට් ?
ඔයා පරක්කු වුනාද ?

Did she get angry ?
ඩිඩ් ෂී ගෙට් ඇංග්‍රි ?
ඇය කේන්ති ගත්තද ?

Did they blame you ?
ඩිඩ් දේ බ්ලේම් යූ ?
ඔවුන් ඔයාට බැන්නද ?

Did it rain yesterday ?
ඩිඩ් ඉට්(ඩිඩිට්) රේන් යෙස්ටඩේ ?
ඊයේ වැස්සද ?

Did they ask you to come ?
ඩිඩ් දේ ආස්ක් යූ ටු කම් ?
ඔවුන් ඔබට එන්න කිව්වද ?

Did you hear that scream ?
ඩිඩ් යූ හියු(ර්) දැට් ස්ක්‍රීම් ?

ඔයාට ඒ කෑගැහිල්ල ඇහුනද ?

Did it hurt ?
ඩිඩ් ඉට් (ඩිඩිට්) හ(ර්)ට් ?
ඒක රිදුනද ?

Did you get hurt ?
ඩිඩ් යූ ගෙට් හ(ර්)ට් ?
ඔයාට තුවාල වුනාද ?

Did she tell you about the incident ?
ඩිඩ් ෂී ටෙල් යූ අබවුට් දි ඉන්සිඩන්ට් ?
ඇය ඔබට සිදුවීම ගැන කිව්වද ?

Didn't they invite you to the party ?
ඩිඩින්ට් දේ ඉන්වයිට් යූ ටු ද පාටි ?
ඔවුන් ඔයාට පාටියට ආරාධනා කලේ නැද්ද ?

Didn't she call you ?
ඩිඩින්ට් ශී කෝල් යූ ?
ඇය ඔයාට කෝල් කලේ නැද්ද ?

Didn't he give it back ?
ඩිඩින්ට් හී ගිව් ඉට් (ගිවිට් ) බැක් ?
ඔහු ඒක ආපසු දුන්නේ නැද්ද ?

Didn't she turn up ?
ඩිඩින්ට් ෂී ට(ර්)න් අප් ?
ඇය ආවේ නැද්ද ?

Lesson 13

## Spoken English

මෙම පාඩමේදී කෙටි ඉල්ලීම් හෝ විධාන සිදුකරන කෙටි වාක්‍ය ඛණ්ඩ කිහිපයක් ඉගෙන ගනිමු. මොකද ඉංග්‍රීසි කථාවේදී ඒවා ඉතා ප්‍රයෝජනවත් වෙන නිසා. මතක තබාගන්න ඉංග්‍රීසි බසින් මෙම ඉල්ලීම් හෝ විධාන පාවිච්චි කරද්දී එසේ කළයුතු යැයි ඔබට හැඟෙන සෑම අවස්ථාවකම please යන වචනය එකතු කරන්න. එසේ නොමැති වුවහොත් එය එතරම් ආචාරශීලී නැහැ

Please get aside
ප්ලීස් ගෙට් අසයිඩ්
කරුණාකරලා පොඩ්ඩක් පැත්තකට වෙන්න

Please move over
ප්ලීස් මූව් ඕවර්
කරුණාකරල පොඩ්ඩක් එහාට යන්න

Bring me some water
බ්‍රින් මී සම් වෝට(ර්)
මට වතුර ටිකක් ගේන්න

Take some rest
ටේක් සම් රෙස්ට්
පොඩි විවේකයක් ගන්න

Turn up the volume
ට(ර්)න් අප් ද වොලියුම්
සද්දෙ වැඩි කරන්න

Turn down the volume
ට(ර්)න් ඩවුන් ද වොලියුම්
සද්දේ අඩු කරන්න

(රේඩියෝ එකක. කැසට් එකක. රූපවාහිනියක වැනි )

Take/ have a look
ටේක් / හැව් අ ලුක්
පොඩ්ඩක් බලන්න

Keep your voice down
කීප් යුව(ර්) වොයිස් ඩවුන්
හිමින් කතා කරන්න/සද්ද කරන්න එපා

Give me a hand in this
ගිව් මී අ හෑන්ඩ් ඉන් දිස්
මට මේකට සහයෝගයක් දෙන්න

Wipe the table
වයිප් ද ටේබල්
මේසෙ පිහදාන්න

Do me a favour
ඩු මී අ ෆේව(ර්)
මට උදව්වක් කරන්න.

keep the light on
කීප් ද ලයිට් ඔන්
ලයිට් එක දාල තියන්න .

Go and see
ගෝ ඇන්ඩ් සී
ගිහින් බලන්න.

come quickly
කම් ක්වික්ලි
ඉක්මනට එන්න

Eat/ drink something
ඊට් / ඩ්‍රින්ක් සම්තින්
මොනවහරි කන්න/බොන්න

Have something to eat/drink
හැව් සම්තින්ග් ටු ඊට් / ඩ්‍රින්ක්
මොනවහරි කන්න /බොන්න.

Swich on/off the fan
ස්විච් ඔන් /ඔෆ් ද ෆෑන්
ෆෑන් එක ඔන් කරන්න /ඕෆ් කරන්න

Throw it away
ත්‍රෝ ඉට් අවේ
ඒක වීසි කරන්න

Open the door/window/ shutter
ඕපන් ද ඩෝ/වින්ඩෝ /ෂට(ර්)
දොර/ජනේලෙ/ වීදුරුව අරින්න.

Make it short
මේක් ඉට් ෂෝට්
කෙටි කරන්න

Close the door/window/ shutter
ක්ලෝස් ද ඩෝ/වින්ඩෝ/ෂට(ර්)
දොර/ජනේලෙ/ වීදුරුව වහන්න

Keep the door/window open
කීප් ද ඩෝ/වින්ඩෝ ඕපන්
දොර/ජනේල ඇරල තියන්න

Keep the door/window closed
කීප් ද ඩෝ/වින්ඩෝ ක්ලෝස්ඩ්
දොර/ජනේල වහල තියන්න.

Switch on/off the T.V
ස්විච් ඔන් / ඕෆ් ද ටි වී
ටී වී එක ඔන් කරන්න /ඕෆ් කරන්න.

Switch on/off the light
ස්විච් ඔන් / ඕෆ් ද ලයිට්
ලයිට් එක දාන්න / ලයිට් එක නිවන්න

Take this away
ටේක් දිස් අවේ
මේක අහකට ගන්න /අයින් කරන්න

Keep this with you
කීප් දිස් විත් යූ
මේක ඔයා ලඟ තියාගන්න

Take it easy
ටේක් ඉට් ඊසි
ඒක සැහැල්ලුවට ගන්න /ගණන් ගන්න එපා

Wait a minute
වේට් අ මිනිට්
මිනිත්තුවක් ඉන්න

Listen to me
ලිස්න් ටු මී
මම කියනදේ අහන්න

Come quickly
කම් ක්වික්ලි
ඉක්මනට එන්න

Keep it there
කීප් ඉට් දෙයා(ර්)
ඒක එතන තියන්න

Take it out
ටේක් ඉට් අවුට්
ඒක එලියට ගන්න

Calm down
කාම් ඩවුන්
සන්සුන් වෙන්න

Take your time
ටේක් යුව(ර්) ටයිම්
වෙලාව ගන්න(හෙමින් කරන්න)

Keep it in mind
කීප් ඉට් (කීපිට් ) ඉන් මයින්ඩ්
ඒක මතක තියා ගන්න

Let go of my hand
ලෙට් ගෝ ඔෆ් මයි හෑන්ඩ්
මගෙ අත අතහරින්න

Take some rest
ටේක් සම් රෙස්ට්
ටිකක් විවේක ගන්න

Let me see
ලෙට් මී සී
මට බලන්න දෙන්න ( කෝබලන්න)

Throw it off the window
ත්‍රෝ ඉට් ඕෆ් ද වින්ඩෝ
ඒක ජනේලෙන් එලියට විසි කරන්න

Put it there
පුට් ඉට් දෙයා(ර්)
ඒක එතනින් තියන්න

Light a match
ලයිට් අ මැච්
ගිනිකූරක් පත්තුකරන්න

Let me go
ලෙට් මී ගෝ
මට යන්න දෙන්න

Let go of me
ලෙට් ගෝ ඔෆ් මී
මාව අතඅරින්න

Ring the bell
රින් ද බෙල්
බෙල්එක ගහන්න

Give it to me
ගිව් ඉට් (ගිව්ට්) ටු මී
ඒක මට දෙන්න

Give it a try
ගිව ඉට් අ ට්‍රයි
ඒකට උත්සාහයක් කරන්න

Be quick
බී ක්වික්
ඉක්මන් කරන්න

Hang it there
හැන්ග් ඉට් දෙයා(ර්)
ඒක අතනින් එල්ලන්න

Hang it on the wall
හැන්ග් ඉට් ඔන් ද වෝල්
ඒක බිත්තියෙ එල්ලන්න

Keep it a secret
කීප් ඉට්(කීපිට් ) අ සීක්‍රට්
ඒක රහසක් විදියට තියාගන්න

Keep it to yourself
කීප් ඉට් ටු යුව(ර්)සෙල්ෆ්
ඒක රහසක් විදියට තියාගන්න

Keep silent
කීප් සයිලන්ට්
නිශ්ශබ්දව ඉන්න

Press the button
ප්‍රෙස් ද බටින්
බටින් එක ඔබන්න

Listen to what I say
ලිස්න් ටු වට් අයි(වටයි) සේ
මම කියන දේට ඇහුම් කන් දෙන්න

Fix a date / time
ෆික්ස් අ ඩේට් / ටයිම්
දිනයක් /වෙලාවක් දාගන්න

Hurry up
හරි අප්
ඉක්මන් කරන්න

Hold this for a second
හෝල්ඩ් දිස් ෆෝ අ සෙකන්ඩ්
මේක තත්පරෙකට අල්ල ගන්න

Wait a minute / second
වේට් අ මිනිට් /සෙකන්ඩ්
මිනිත්තුවක් / තත්පරයක් ඉන්න

Clean up the kitchen
ක්ලීන් අප් ද කිචන්
කුස්සිය පිරිසිදු කරන්න

Tidy up the room
ටයිඩි අප් ද රූම්
කාමරය අස්පස් කරන්න

Let me know
ලෙට් මී නෝ
මට කියන්න / දන්වන්න

Give me a ring
ගිව් මී අ රිං
මට කෝල් එකක් දෙන්න

Remind me later
රිමයින්ඩ් මී ලේට(ර්)
මට පස්සෙ මතක් කරන්න

Mind your own business
මයින්ඩ් යුව(ර්) ඕන් බිස්නස්
ඔයාගෙ වැඩක් බලා ගන්න

Pour some water
පෝ සම් වෝට(ර්)
වතුර ටිකක් වක්කරන්න

Be there in time
බී දෙයා(ර්) ඉන් ටයිම්
වෙලා ඇතුව එතන ඉන්න

Remove your hat
රිමූව් යුව(ර්) හැට්
ඔයාගෙ තොප්පිය ගලවන්න

Get to the work
ගෙට් ටු ද ව(ර්)ක්
වැඩේට බහින්න

Keep your word
කීප් යුව(ර්) ව(ර්ඩ්
ඔයාගෙ වචනෙ ඉෂ්ට කරන්න

Lie down here
ලයි ඩවුන් හියු(ර්)
මෙහෙන් ඇලවෙන්න

Remove the lid
රිමූව් ද ලිඩ්
පියන/මූඩිය අයින් කරන්න

Give him the message
ගිව් හිම් ද මෙසේජ්
ඔහුට පනිවිඩය දෙන්න

Do it right now
ඩූ ඉට් රයිට් නව්
දැන්මම ඒක කරන්න

Listen to me
ලිස්න් ටු මී
මට ඇහුම්කන් දෙන්න

Watch your steps
වොච් යුව(ර්) ස්ටෙප්ස්
බලාගෙන අඩිය තියන්න

Wait for me
වේට් ෆෝ මී
මං එනකල් ඉන්න

Hold this for a second
හෝල්ඩ් දිස් ෆෝ අ සෙකන්ඩ්
පොඩ්ඩකට මේක අල්ලගන්න
(second -තත්පරය)

Think it over
තිංක් ඉට් ඕව(ර්)
ඒ ගැන හිතන්න

Do something quickly
ඩූ සම්තිං ක්වික්ලි
ඉක්මන්ට මොනවා හරි කරන්න

Keep your promise
කීප් යුව(ර්) ප්‍රොමිස්
ඔයාගෙ පොරොන්දුව ඉෂ්ට කරන්න

Apply some oil
ඇප්ලයි සම් ඔයිල්
තෙල් ටිකක් ගාන්න

Shake the bottle
ශේක් ද බොට්ල්
බෝතලය හොලවන්න

Calm her down
කාම් හ(ර්) ඩවුන්
ඇයව සන්සුන් කරන්න

Stop your nonsense
ස්ටොප් යුව(ර්) නොන්සන්ස්
ඔයාගෙ විකාර නවත්තන්න

Stop talking
ස්ටොප් ටෝකිං
කතාව නතර කරන්න

Write your name
රයිට් යු(වා)ර් නේම්
ඔයාගේ නම ලියන්න

Underline the sentence
අන්ඩ(ර්)ලයින් ද සෙන්ටෙන්ස්
වාක්‍යය යටින් ඉරක් අඳින්න

Take/ have a look
ටේක් / හැව් අ ලුක්
පොඩ්ඩක් බලන්න

Keep your voice down
කීප් යුව(ර්) වොයිස් ඩවුන්
හිමින් කතා කරන්න

Go and see
ගෝ ඇන්ඩ් සී
ගිහින් බලන්න.

Come quickly
කම් ක්වික්ලි
ඉක්මනට එන්න

Eat/ drink something
ඊට් / ඩ්‍රින්ක් සම්තින්
මොනවහරි කන්න/බොන්න

Have something to eat/drink
හැව් සම්තිං ටු ඊට් / ඩ්‍රින්ක්
මොනවහරි කන්න /බොන්න.

Repeat after me
රිපීට් ආෆ්ට(ර්) මී
මං කිව්වට පස්සේ කියන්න

Pay attention
පේ අටෙන්ෂන්
අවධානය යොමු කරන්න

Say it again
සේ ඉට් අගේන්
ඒක ආයෙ කියන්න

Show me
ශෝ මී
මට පෙන්වන්න

Wait your turn
වේට් යු(වා)ර් ටර්න්
ඔයාගේ වාරය තෙක් රැඳී ඉන්න

Help your friend
හෙල්ප් යු(වා)ර් ෆ්‍රෙන්ඩ්
ඔයාගේ යාළුවාට උදව් කරන්න

Keep it here
කීප් ඉට් හි(යා)ර්
ඒක මෙතන තබන්න

Give me your book
ගිව් මී යු(වා)ර් බුක්
ඔයාගේ පොත මට දෙන්න

Read aloud
රීඩ් අලව්ඩ්
හයියෙන් කියන්න

Underline the word
අන්ඩලයින් ද ව(ර්)ඩ්
වචනය යටින් ඉරක් ඇඳන්න

Cut it out
කට් ඉට් අවුට්
ඒක කපන්න

Look this way
ලුක් දිස් වේ
මේ පැත්ත බලන්න

Be kind
බී කයින්ඩ්
කරුණාවන්ත වෙන්න

Look after your things
ලුක් ආෆ්ට(ර්) යු(වා)ර් තිංග්ස්
ඔයාගේ දේවල් පරිස්සම් කරන්න

Come to the front
කම් ටු ද ෆ්‍රන්ට්
ඉදිරියට එන්න

Stand in a line
ස්ටෑන්ඩ් ඉන් අ ලයින්
පේළියකට හිටගන්න

Put on your shoes
පුට් ඔන් යුව(ර්) ෂූස්
සපත්තු දාගන්න

Put your bag away
පුට් යුව(ර්) බැග් අවේ
බෑග් එක අරන් පැත්තකින් තබන්න

Come in
කම් ඉන්
ඇතුලට එන්න

Fold the paper
ෆෝල්ඩ් ද පේප(ර්)
කඩදාසිය නවන්න

Sit properly
සිට් ප්‍රොප(ර්)ලි
හරියට වාඩි වන්න

Be careful
බී කෙයා(ර්)ෆුල්
පරිස්සම් වෙන්න

Always keep an eye
ඕල්වේස් කීප් ඇන් අයි
නිතරම ඇහැ ගහ ගෙන ඉන්න

Pass this to the back
පාස් දිස් ටු ද බැක්
මේක පිටුපසට යවන්න

Follow the rules
ෆොලෝ ද රූල්ස්
නීති අනුගමනය කරන්න

Take off your shoes
ටේක් ඔෆ් යුව(ර්) ෂූස්
සපත්තු ගලවන්න

Get your bag ready
ගෙට් යුව(ර්) බෑග් රෙඩි
ඔයාගේ බෑග් එක රෙඩි කරගන්න

Go out
ගෝ අවුට්
පිටතට යන්න

Be on time
බී ඔන් ටයිම්
වෙලාවට ඉන්න / වෙලාවට එන්න

Line up
ලයින් අප්
පේළි ගැහෙන්න

Keep silent
කීප් සයිලන්ට්
නිශ්ශබ්දව ඉන්න

Pour some water
පෝ සම් වෝට(ර්)
වතුර ටිකක් වක්කරන්න

Be there in time
බී දෙයා(ර්) ඉන් ටයිම්
වෙලා ඇතුව එතන ඉන්න

Get to the work
ගෙට් ටු ද ව(ර්)ක්
වැඩේට බහින්න

Do it right now
ඩූ ඉට් රයිට් නව්
දැන්මම ඒක කරන්න

Go back to your seat
ගෝ බැක් ටු යුව(ර්) සීට්
ඔබගේ ආසනයට ආපසු යන්න

Keep your room clean
කීප්යුව(ර්) රූම්ක්ලීන්
ඔබේ කාමරය පිරිසිදු තබාගන්න

Pass this to the back
පාස් දිස් ටු ද බැක්
මේක පිටුපසට යවන්න (අතින් අත )

Finish the work
ෆිනිෂ් ද ව(ර්)ක්
වැඩේ ඉවර කරන්න

Walk in a line
වෝක් ඉන් අ ලයින්
පේළියට යන්න

Remind me later
රිමයින්ඩ් මී ලේට(ර්)
මට පස්සෙ මතක් කරන්න

Wait for me
වේට් ෆෝ මී
මං එනකල් ඉන්න

Hold this for a second
හෝල්ඩ් දිස් ෆෝ අ සෙකන්ඩ්
පොඩ්ඩකට මේක අල්ලගන්න

Do something quickly
ඩූ සම්තිං ක්වික්ලි
ඉක්මන්ට මොනවා හරි කරන්න

Stop your nonsense
ස්ටොප් යුව(ර්) නොන්සන්ස්
ඔයාගෙ විකාර නවත්තන්න

Take turns
ටේක් ට(ර්)න්ස්
මාරුවෙන් මාරුවට කරන්න

Speak politely
ස්පීක් පොලයිට්ලි
ආචාරශීලීව කතා කරන්න

Come early
කම් අ(ර්)ලි
වේලාසනින් එන්න

Solve the problem together
සෝල්ව් ද ප්‍රොබ්ලම් ටුගෙද(ර්)
එක්කහු වෙලා ගැටලුව විසඳන්න

Ask any questions
ආස්ක් එනි ක්වෙස්චන්ස්
ඕන ප්‍රශ්නයක් අහන්න

Write in complete sentences
රයිට් ඉන් කම්ප්ලීට් සෙන්ටන්සස්
සම්පූර්ණ වාක්‍ය වලින් ලියන්න

Try your best
ට්‍රයි යුව(ර්) බෙස්ට්
උපරිම උත්සාහ කරන්න

Follow my instructions carefully
ෆොලෝ මයි ඉන්ස්ට්‍රක්ෂන්ස් කෙයාෆුලි
මගේ උපදෙස් ප්‍රවේශමෙන් අනුගමනය කරන්න

Say it again
සේ ඉට් අගේන්
ඒක ආපහු කියන්න

Don't bother your classmates
ඩෝන්ට් බොද(ර්) යුව(ර්) ක්ලාස්මේට්ස්
ඔයාගේ පන්තියේ සගයන්ට කරදර කරන්න එපා

Take some medicine
ටේක් සම් මෙඩිසින්
බෙහෙත් ටිකක් ගන්න

Speak one at a time
ස්පීක් වන් ඇට් අ ටයිම්
එකවර එක් කෙනෙක් විතරක් කතා කරන්න

Stay at home today
ස්ටේ ඇට් හෝම් ටුඩේ
අද ගෙදර ඉන්න

Take your parent 's permission
ටේක් යුව(ර්) පෙරන්ට්'ස් ප(ර්)මිෂන්
ඔයාගේ දෙමව්පියන්ගේ අවසරය ගන්න

Be punctual
බී පංක්චුවල්
වෙලාවට වැඩ කරන්න

**Vocabulary 13**

Get back – ගෙට් බැක් – ආපසු එනවා
Ring up – රිං අප් – දුරකථනයෙන් කතා කරනවා
Finger – ෆිංග(ර්) – ඇඟිල්ල
Slip – ස්ලිප් – ලිස්සනවා
Slipped -ස්ලිප්ඩ් - ලිස්සුවා
Injure – ඉන්ජ(ර්) – තුවාල වෙනවා
Injured - ඉන්ජ(ර්ඩ් -තුවාල වුනා
Injury – ඉන්ජරි – තුවාලය
Receive – රිසීව් – ලැබෙනවා

Rush – රෂ් – ඉක්මනින් යනවා /එනවා
In a hurry – ඉන් අ හරි – හදිසියක , ඉක්මනක
Apply – ඇප්ලයි – අයදුම් කරනවා
Ask for – ආස්ක් ෆෝ – ඉල්ලනවා
Grant – ග්‍රාන්ට් – ලබාදෙනවා
Put on – පුට් ඔන් (පුටෝන් ) – (ඇඳුමක් ) ඇඳගන්නවා
Suddenly – සඩ්න්ලි – හදිසියේම , හිටපු ගමන්
Hit – හිට් – ගහනවා
Awake – අවේක් – අවදි වෙනවා / අවදිව සිටිනවා
Awoke -අවෝක් - අවදි වුනා
Scream – ස්ක්‍රීම් – කෑගහනවා
Kiss – කිස් – සිපගන්නවා , හාද්ද
Cheek – චීක් – කම්මුල
Behave – බිහේව් – හැසිරෙනවා
Go on – ගෝ ඔන් – දිගටම කෙරී ගෙන යනවා
Nicely – නයිස්ලි – හොඳින් , ලස්සනට
Realize – රියලයිස් – අවබෝධ කරගන්නවා
Last – ලාස්ට් – අවසාන

Last – ලාස්ට් – කල් පවතිනවා

Last long – ලාස්ට් ලෝං – දිගු කාලයක් පවතිනවා

Through – තෲ – හරහා

Die – ඩයි – මැරෙනවා

Cancer – කැන්ස(ර්) – පිළිකාව

Heart attack – හාට් ඇටෑක් – හෘදයාබාධය

Hope – හෝප් – බලාපොරොත්තු වෙනවා , බලාපොරොත්තුව

Give up – ගිව් අප් (ගිවප් ) – අත්හැර දමනවා

Promise – ප්‍රොමිස් – පොරොන්දු වෙනවා , පොරොන්දුව

Keep a promise – කීප් අ ප්‍රොමිස් – පොරොන්දුව ඉටු කරනවා

Purse – ප(ර්)ස් – පසුම්බිය

Incident – ඉන්සිඩන්ට් – සිදුවීම

Invite – ඉන්වයිට් – ආරාධනා කරනවා

Invitation – ඉන්විටේෂන් – ආරාධනාව

Turn up – ට(ර්)න් අප් – පැමිනෙනවා

Aside – අසයිඩ් – පැත්තකට

Get aside – ගෙට් අසයිඩ් – පැත්තකට වෙනවා

Move – මූව් – ගමන් කරනවා / සෙලවෙනවා

Turn down – ට(ර්)න් ඩවුන් – ප්‍රතික්ෂේප කරනවා

Favour – ෆේව(ර්) – උදව්ව

Quickly – ක්වික්ලි – ඉක්මනින්

Throw – ත්‍රෝ – විසි කරනවා

Calm – කාම් – සන්සුන්

Switch on – ස්විච් ඔන් (ස්විචෝන් )– විදුලි උපකරණයක් ඔන් කරනවා

Switch off – ස්විච් ඕෆ් ( ස්විචෝෆ් ) – විදුලි උපකරණයක් ඕෆ් කරනවා

Mind – මයින්ඩ් – හිත , මනස

Mind – මයින්ඩ් – සිතට ගන්නවා , සිහියේ රඳවා ගන්නවා , සැලකිලිමත් වෙනවා

Button – බටින් – බොත්තම

Hold – හෝල්ඩ් – අල්ලගෙන ඉන්නවා

Fix – ෆික්ස් – සකස් කරනවා , පිළිසකර කරනවා

Fix - ෆික්ස් - දිනයක් වෙලාවක් යොදා ගන්නවා

Hang – හැං – එල්ලනවා

Tidy up – ටයිඩි අප් – එකලස් කරනවා, පිළිවෙල කරනවා

Secret – සීක්‍රට් – රහස

Silent – සයිලන්ට් – නිශ්ශබ්ද

Remind – රිමයින්ඩ් – මතක් කරනවා

Pour – පෝ – වක් කරනවා

Remove – රිමූව් – ඉවත් කරනවා

Shake – ෂේක් – හොලවනවා

Underline – අන්ඩ(ර්)ලයින් – යටින් ඉරක් අඳිනවා

Sentence – සෙන්ටන්ස් – වාක්‍යය

Voice – වොයිස් – කටහඬ

Repeat – රිපීට් – නැවත කියනවා

Attention – අටෙන්ෂන් – අවධානය

Turn – ට(ර්)න් – හරවනවා

Turn -- ට(ර්)න් -- වාරය

Aloud – අලවුඩ් – උස් හඬින්

Fold – ෆෝල්ඩ් – නවනවා

Shout – ෂවුට් – කෑගහනවා

Front – ෆ්‍රන්ට් – ඉදිරිපස

Follow – ෆොලෝ – අනුගමනය කරනවා

Line – ලයින් – පේළිය

Politely – පොලයිට්ලි – විනීත ලෙස , ආචාරශීලී ලෙස

Solve – සෝල්ව් – විසඳනවා

Question – ක්වෙස්චන් – ප්‍රශ්නය

Complete – කම්ප්ලීට් – සම්පූර්ණ කරනවා

Carefully – කෙයාෆුලි – සැලකිල්ලෙන්

Classmate – ක්ලාස්මේට් – පංති මිතුරා

Parent – පේරන්ට් – දෙමාපියන්ගෙන් කෙනෙක්

Permission – ප(ර්)මිෂන් – අවසර